# පුරප්පාඩු දැන්වීමයි
# මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## මහනුවර මහා නගර සභාවේ ප්‍රධාන ගණකාධිකාරී තනතුරට සුදුසුකම්ලත් නිලධාරියෙකු පත් කිරීමට අදාළව අයදුම්පත් කැඳවීම

මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත, රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 04/2023 මධ්‍යම පළාත වෙත අදාළ කර ගනිමින්, මහනුවර මහා නගර සභාවේ පුරප්පාඩු වී ඇති ප්‍රධාන ගණකාධිකාරී තනතුරට සුදුසුකම්ලත් නිලධාරියෙකු පත් කිරීම සඳහා මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නියුතු ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියට උසස්වීම් ලැබ, එහෙත් I ශ්‍රේණියේ තනතුරකට පත්කර නොමැති නිලධාරීන් වෙතින් අභ්‍යන්තර වශයෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. (දැනට විධිමත් පරිදි I ශ්‍රේණියේ තනතුරුවලට පත්වීම් ලද නිලධාරීන් මේ සඳහා අයදුම් කිරීම අවශ්‍ය නොවේ)

**01.** වෙනත් සුදුසුකම්

i. මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නියුතු ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියට උසස්වීම් ලැබ, එහෙත් I ශ්‍රේණියේ තනතුරකට පත්කර නොමැති නිලධාරීන් වෙතින් පමණක් අයදුම්පත් කැඳවනු ලබන බැවින් වයස් සීමාවක් අදාළ නොවේ.
ii. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හා 01/2020(I) හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

**02.** බඳවා ගැනීමේ ක්‍රමය

මෙම නිවේදනයේ දක්වා තිබෙන සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ අයදුම්කරුවන් අතුරින් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින්, කුසලතා නිශ්චය කිරීමට අදාළව රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 04/2023හි සඳහන් මාර්ගෝපදේශවලට අනුව පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකදී, ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා ඉහත අදාළ පුරප්පාඩුව සඳහා තෝරා පත් කරනු ලැබේ.
(අනුමත ලකුණු නිර්ණායක www.psc.cp.gov.lk යන වෙබ් අඩවියෙහි පළ කර ඇත.)

**සටහන:** සුදුසුකම් සනාථ කෙරෙන සියලුම සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත්, ජාතික හැඳුනුම්පතේ හා උප්පැන්න සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය.

**03.** අයදුම්පත් ඉදිරිපත් කිරීම

- විධිමත්ව හා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්, දෙපාර්තමේන්තු ප්‍රධානියා, අදාළ අමාත්‍යාංශ ලේකම් සහ ප්‍රධාන ලේකම්ගේ නිර්දේශ සහිතව **" ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 244, කටුගස්තොට පාර, මහනුවර"** යන ලිපිනයට **2025.08.12 වන දින හෝ ඊට පෙර** ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.
- අයදුම්පත බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"මහනුවර මහා නගර සභාවේ ප්‍රධාන ගණකාධිකාරී තනතුර සඳහා අයදුම්පත් කැඳවීම"** යනුවෙන් සඳහන් කළ යුතුය. .
- නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත් , අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයගේ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- අයදුම්පත් ප්‍රමාද වීම හෝ නැති වීම පිළිබඳ කිසිදු පැමිණිල්ලක් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව භාර ගනු නොලැබේ.

(ආදර්ශ අයදුම්පත්‍රයක් www.psc.cp.gov.lk යන වෙබ් අඩවියෙන් බාගත කර ගත හැකිය)

**04.** මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙහි විධිවිධාන සළසා නොමැති සියළුම කරුණු පිළිබඳ තීරණ ගැනීමේ බලය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

මෙයට මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

සුජානි ආර්. විජේතුංග,
ලේකම් (වැ.බ.),
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2025 ජූලි මස 24 වැනි දින.
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා
කාර්යාලයේදීය